ශීර්ෂ 317 - උතුරු මැද පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත්, අභිමානවත් ජනතාවකගෙන් පිරිපුන් පළාතක් රටට දායාද කිරීම.

1.2 මෙහෙවර

මධ්‍යම රජය, පළාතේ මහජනතාව හා ජනතා නියෝජිතයින් ප්‍රමුඛ කරගත් සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගේ ප්‍රශස්ත උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ධරණීය ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිද භාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

උතුරු මැද පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.16,641,079,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.13,155,307,816 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.3,485,771,184 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 13,027,879,000 | 10,593,879,000 | 2,434,000,000 | 19 |
| මූලධන | 3,613,200,000 | 2,561,428,816 | 1,051,771,184 | 29 |
| එකතුව | 16,641,079,000 | 13,155,307,816 | 3,485,771,184 | 21 |

මධ්‍යම රජය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.